# <u>අර්ගන් ගස</u>

මතකයන් අවදි කරවා ගැනීමට ඇය සෑම දිනකම සැමියාගේ සොහොන වෙත පැමිණීම පුරුද්දක් කරගෙන සිටියා ය. හිරු බැසීමට ආසන්න වනවිට පවතින උෂ්නත්වය තරමක් අඩුවන බැවින් ඇයට එහි තිබූ අනිත් ගල් වලට වඩා තරමක් විශාල වූ ගලක් ඉදිරියේ දීර්ඝ වේලාවක් ඇණ තියාගෙන සිටීමට හැකිවිය. ඔහු සැතපී සිටියේ එහි ය. ඒ ස්ථානය අවට පරිසරයේ තිබූ ගල්, වැලි, කටු පැලෑටි, කාන්තාරයේ වැවෙන විවිධ ලැවැන්ඩර් පැලවර්ග හා අර්ගන් ගසක් අතරින් මතුවී පෙනුනේ යාන්තමට ය. අර්ගන් ගස යනු දීර්ඝ කාලීනව ඉඩෝරයට හසුවන විට කොල හැලී යන සහ නිද්‍රාගත වන ශාක විශේෂයකි. මැරුණු විලාශයකින් මාස ගණනක් හෝ අවුරුදු ගණනක් එසේම පවතින එම ගස, වැස්සක් වට ගමන්ම දළුලන්නට පටන් ගනියි.

හිස ආවරණය කරගෙන සිටි තඹ හා රිදී පැහැ කාසි හැඩයේ රවුම් වලින් ඔප් නැංවුනු නිල් පැහැති කපු සාළුව විසින් ඇගේ මුහුණේ කොටසක් ආවරණය කෙරුන අතරම එමගින් ඇගේ බැල්මේ වූ සුන්දරත්වය ද වඩාත් කැපී පෙනුණි. එළියට පෙනුනේ දුඹුරු පැහැ ගත් කෙස් කැරැල්ලක් ද, නළල මත ඇඳුනු පච්චයක් ද, දිලිසෙන සුලු කළු දෙනෙත ද පමණි. ඇයට නිශ්චිත වයසක් දීම අපහසුය. ඇය හඩන බවනම් සිතා ගත හැකි විය. විටෙක ඇගේ ඇස අග දිලෙන කඳුලක් ද දැකගත හැකි විය. ඇය නිමා වූ දිනය ගැන සියලු විස්තර සහිතව කියමින් සිටියාය. කිකිලියන් දැමූ බිත්තර ගණන, වගා කටයුතු වල දියුණුව, මදය ලබා ගැනීමට තැලූ අර්ගන් ඇට ගණන..... ඇය ගොඩක් කතා කලා ය. සියලුම දෑ කියා අවසන් යැයි හැඟුණු විට ඇය අතීතය ගැන කතා කලාය. ඔයාට මතකද ? ඔයාට මතකද ? ඔයාට මතකද ?........... ලැබෙනවා යැයි විශ්වාස කිරීමට අපහසු පිළිතුරු ඇසීම සඳහා හෝ බලා සිටීම සඳහා ඇය විටින් විට නිශ්ශබ්දතාවය රැක්කා ය .

හිරු ක්ෂිතිජයේ සැඟවී ගිය පසු ඇය නිවස කරා යන්නට පුරුදුව සිටියේ ගීයක් මුමුණමිනි.

නිවස කරා යාමට ඇය ක්සාර්[1] බලකොටුවේ ප්‍රාකාරය තරණය කරන්නේ ඇතුල් වීමේ දොරටු දෙකෙන් එකක් හරහා යමින්ය. ඉන් පසු ඇය අවතීර්ණ වන්නේ කුඩා මාවත් කිහිපයකින් සැදුණු ගම්මානයට ය. ඒ ගම්මානයේ ගෙවල් මාවත් මත කලවමට ඉදිවී තිබෙන්නේ හරියට ඒවායේ වාසය කරන ගම්වැසියන්ගේ සුහද බව හා එකමුතු බව සනිටුහන් කරන ආකාරයකට ය. ඇගේ නිවස ඉතා කුඩා ගොඩනැගිල්ලක් විය. තුන් මහලකින් සහ මිදුලකින් සැකසූ එය නිමාවී තිබුණේ හිරු එළියෙන් වේලා සාදා ගත්තා වූ ගඩොල් කැට වලිනි. විවිධ ඍතු වලට අනුව එහි ජීවත්වන කොටස් මාරු කෙරිණි. උණුසුම් කාලයට දහවල පාවිච්චි කෙරුණේ බිම් මහලත් පළමු මහලත් පමණි. ඉහල මහල භාවිත කෙරුණේ රාත්‍රියට පමණි. ශීත

---

[1] ක්සාර්: කෙම් බිමක සැදුණු හමුදා ගෘහ නිර්මාණ ශිල්පය අනුව සැකසුණු ගම්මානයක්. එය සණ බිත්ති වලින් වට වී ඇත්තේ සතුරු ප්‍රහාරයන්ට මුහුණ දීමටය.

කාලයට මේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කෙරුණේ අනිත් අතට ය. ඒ සීතල පාලනය කර ගැනීමටය. මේ ගතවන්නේ උණුසුම් කාලය නිසා ඉස්තාලය බිම් මහලට පැමිණ තිබුණි. එළුවෝ කිහිපදෙනෙක් හා කිකිළියෝ සිය පාලිකාව පැමිණෙන තුරු ඉවසීමෙන් බලා සිටියෝ ය. සතුන්ට කෑම දැමූ ඇය, නිදා ගැනීම සඳහා දෙවෙනි තට්ටුවට නැග්ගාය.

ඇය පිදුරු සහ ලොම් ඇතිරුණු යහනක සුවෙන් නිදා සිටියා ය. ඉතා සුවයෙන් නිදා සිටින ඇය, එම රාත්‍රියේ වෙන කවරදාවත් නැති තරමට සිහින දැක්කා ය. ඇගේ සැමියා ඇය ඉදිරියේ සිටගෙන සිටියේ ය. ඉස්තරම්ම ඇඳුමින් සැරසී සිටි ඔහු ඇය නිදාසිටි දෙස ආදරයෙන් බලා සිටියේ ය.

ඇය ධෛර්ය උපදවාගෙන ඔහු ඇමතුවාය. මේ ඔයා ද? ඔයා හරි ලස්සනයි. මූන සනීප පාටයි. ඒ උනාට ඔයා මැරිලා, ඔයා දන්නවද ? මෙච්චර දවසක් කොහෙද හැංගිල හිටියේ?

විස්මයකට මෙන්, ඇගේ සිහිනය අතරතුරේදී ඔහුගේ පිළිතුරු අසා ගැනීමේ බලය ද ඇයට ලැබී තිබිණි. ඔහු ඇයට පිළිතුරු දුනි. ඔයාගේ කතාව හරි. මම මැරිල තමයි. ඒත් මම මේ අද රෑ ඔයාව බලන්න ඔයාගෙ හීනයට ආවෙ මට තේරුණ නිසා ඔයාට මාව ඕනෙ කියලා. ඔයාට තියෙන මගේ ආදරය අනන්තයටත් වඩා දිගයි. ඒ ආදරය කාලය, මරණය ඔය හැමදේම ඉක්මවලා යනවා.

ඇය තත්පරයකට තරම් ඇහැරී යලි නින්දට වැටුණා ය. ඇගේ දෙතොලේ සිනහවක් සිත්තම් වී තිබිණි.

පසුදා ඇය අර්ගන් ගසට වතුර දැමීමට ගියා ය.

ජොන් පෝල් ෆෝර්

පරිවර්තනය : නිරෝෂිණී ගුණසේකර